# පහන් වැට තුළට විත් දල්වන්න පහනක් සුදිලෙන්න කවියක්ව නුඹේ සිතුවිලි සයුරෙන්



## -වියත් පන්හිඳ-

*වියත් කවියන් ලොව දකින හැටි අපූරුය... සොඳුරුය... එවන් කවියන්ගේ කවි.... රස විඳින්නටත්, කවිය කුමක්ද යන්නට අර්ථ සපයා ගන්නටත් මහගු අත්වැලක් වනු ඇත. වියත් පන්හිඳ එයට වෑයමකි.*

උත්තර සමාජයක්
ගොඩ නැගීමේ
මුල් පියවර
කෑමෙන් බීමෙන්
ඇඳුමෙන්
ගෙයින් දොරින්
තෘප්තිමත් වූ
ලොවක් තැනීමය
ඒ සඳහා මම නවතිමි
නැවතීමය ගමන
සංසාරය නිවන..

**-සේකර-**

ඉදිරියට ☞ ☞

## කළගුණ සිහිකර ඇද වැටෙමි ඔබ හමුවේ

සුවිසල් ගසතුරෙන් එන මඳනල ඔස්සේ
සියොතුන් ගී ගයයි බුදිමින් එල රිසිසේ
රන් පට වලින් සැදි සමනලයන් නිසි සේ
පිපි මල් සිඹ සිඹ යයි පෙරටම සතොසේ

අහසින් පැමිණි දෙවගන එබිකම් කරමින්නේ
ගස් අතුරෙන් බලති දෙව් රඟ පාමින්නේ
සුදු බුදු රැසින් මුළු උයනම නාවමිනේ
සිදුහත් බුදු උපත ලද සල් ගස සෙවනේ

දෙව් බඹ මහා සෙනඟ දෙඅත හිස තබා ගෙන
නොඉවසිල්ලෙන් බලති වනයේ සැම තැන
මුළු ලොවටම මම අග වෙමි පවසමින
සිදුහත් කුමරු පියු මත වැඩියේ තුටින

හිමියනි ඔබයි භව ගනඳුර නැති කෙරුවේ
මුළු සතහටම නිසි මහග පෙන්නුම් කෙරුවේ
කළගුණ සිහිකර ඇද වැටෙමි ඔබ හමුවේ
තුටු කඳුළෙන් තෙමේ පා කමල ද නැවේ..

**මාතු එච්. ලියනගේ**




සන්නස පහන් වැටෙහි අරමුණ කවියට, කලාවට ලැදි පරපුරක් බිහි කිරීම සඳහා හැකි උපරිම දායකත්වය ලබා දීමයි. උපරිමයෙන් කවි පිටුව පුරවන්නේ ද මෙනිසාය. තතනමින් පද එකතු කර, කවියක් සේ තම සිතැඟි ඉදිරිපත් කරන කවරෙකුට වුවද සන්නසෙහි ඉඩ සැදෙනුයේ ඔහු මතු දිනයෙක දක්ෂ, යහපත් කවියෙකු වනු දැකීම උදෙසාය. පහන් වැට ඔබගේම වන්නේ ද එනිසාය.

*ඔබේ නිර්මාණ මෙම ලිපිනයට එවන්න.*
Sannasa Pahan Weta
61 Nattle Drive
Hallam Vic 3803
Australia
**Email:**
sannasanews@gmail.com


## වසන්තය

සීතලෙන් ගල් වුණ මිහිකත
හිම කැටි තුරුළු කරගත් ගහ කොළ
විහඟුනට නැත විසුමක්
යා යුතුය
සුදුසු දෙසකට

දුරු කතර ගෙවා පැමිණ
කෙම් බිම් කරා
කැදලි සැදුවෝය උන්
බිහි කළෝය නව පරපුරක්

වසන්තය උදා විය
ඇරඹීය ගමනක්
පතිරූප දේශය සොයා
නව පරපුරක් සමඟින්
පැමිණියෝය උන්
නැත කිසිදු වෙනසක්
හැඩ රුවේ... ගී හඬේ... දිවි මගේ...

**සී. කරුණාරත්න**

## නුදුටු පුතුට

මගේ කුස තුළ දස මසක් ඉඳ
ගැසූ අත් පා ඇයි නිහඬ අද
නුඹෙ හදවත නැවතුණේ ඇයි
මෙමා නුඹෙ රුව දකින කලියෙන

කෑ දෙයක් දැයි බිවූ දෙයක්දැයි
මගේ සිත අසමින් අඬයි පැණ
විඳින්නට මේ වැනි දුකක් මා
කුමක්දැයි පෙර බවේ කල පව

මගේ කඳුළැලි දකියි හැම දෙන
ඒ නමුදු පුත ඔබ පියාගේ
හදේ ගින්දර ඔහු දවාලන
කඳුළු දුටුවේ මෙමා පමණයි

මගේ කුස අත ගගා සිටි ඔබෙ
අයියණ්ඩි තවමත් බලා ගෙන
නුඹට ඔහු තෝරලා දුන් නම
කියා නුඹහට කතා කෙරුමට

මතු වෙවී එන සිතුම් වැල් හා
පොර බදමි මම ගලපන්න පද
අහිංසක ඔහු දෙස බලා ගෙන
කෙසේ මෙපුවත පහදා දෙන්නද??

**කමලිකා ගුණරත්න**

## අම්මා

ඔබේ ජීවන සුවඳ අම්මේ
මගේ ලොව ඔපවත් කරන්නේ
එවන් අමිල වූ ඔවදන් අම්මේ
මහද මතක කිරුළ දරන්නේ
එකී බස් ඔප වී හද ගැඹරේ
ආත්මය සුව දෙයි දිවි අඹරේ

සිව් විහරණ ගුණ හදවත උනනා
ගෙදර බුදුන් විරුදා ලද අම්මා
සෙනේ ගුණේ තෙත නෙතග දිලුණා
සදා නොමියෙන ගුණය අම්මා
එකී බස් ඔප වී හද ගැඹරේ
ආත්මය සුව දෙයි දිවි අඹරේ
සිතෙහි සුවහස් පැතුම් පතා ගෙන
මගේ ලොව සුවපත් කළේ
දයා ගුණේ හද දෝර ගලා ගෙන
ලොවට මනාපෙන් තිළිණ කළේ
එකී බස් ඔප වී හද ගැඹරේ
ආත්මය සුව දෙයි දිවි අඹරේ

**ඩබ්.එච්.එම් ගුණරත්න මැණිකේ**
පුස්සැල්ල-කෑගල්ල

Lighting one candle
With another candle
An evening of Spring

(Buson)

### හුදෙකලාව

තරු ඇතින් දිලිසේ
සීතල රැය ද
සොඳුරුයි
නෙතු සිහින පුබුදයි
තනි සිතට අවිවේකයි...

**නිල්මිණි ප්‍රියදර්ශිකා**
ජර්මනිය

# පහන් වැට

සංස්කරණය
**තුෂාරී ප්‍රියංගිකා**

## පුරුක් බිඳි එවුන්

පුරුකෙන් බැඳුනු තුගු උණබට කඳ
නොබිඳෙන්නට බඳන පොර ඒදිරිව
නි ර්දය සුළඟ අභිමුව

පුරුක් බිඳි එවුන්මය
නැමෙන තරමක්
නොනැසී
රැඳෙන්නට සුව පහසුව

**ඊ.ජ්.ඩෝසන් ප්‍රීති**

### එළිය

හඳට
බැරි-වෙයිද
ලොකුවෙන්න
තව ටිකක්-
ගමට
ලයිට් එනතුරු

**තරංග ජයසේන**

තොදොල් බස් ටිකිරි මොළ
සුර ලොවින් නැගෙන විට
ආදරයේ ගුණ සුවඳ
මගේ ලොවින් යනෙන කළ
බිඳෙන බඳුන් සුමට ලෙස
සුරකිම්ද සිතුණි මට

**අංජන ජයවීර**

## යුද්ධය

*සියළු ගහ කොළ*
*බිරන්තට්ටුව*
*යදී අහසට*
*දෑත් දිගු කොට*

*සියොත් හඬ නැති*
*ගිගුරුමක් මිස*
*පොළොව කම්පිත*
*දෙකඩ කරවන*

*දැවුණු තණපත්*
*සෙලවුමක් නැත*
*රුහිරු බිඳු*
*බොල් පිණි මකාලන*

*දිවිය අයදින*
*මරහඬක් අග*
*විසුණු වී යන*
*යදැඹු ගත සිත*

*කළු දුමාරය*
*දෙනෙත් වළකන*
*ඉදිරි මග*
*කළු සළකුණක් වන*

*දෙපස වැතිරී*
*මාන අවුළන*
*රොබෝ කැළ*
*මනු වගෙන් පැවතෙන*

**සමන්ති නාමරත්න**
*ග්ලෙන්රෝයි*

## සකලබුජං

වයස හතේ අටේ පටං
කොට කලිසම ඉනේ බැඳං
අපේ ගෙදර බැල මෙහෙවර
කරපු කොලූ සකලබුජං

අම්මෙක් නැති සකලබුජං
අප්පෙක් නැති සකලබුජං
මම පාසැල් ගොස් එනතුරු
ගෙදර හිටිය සකලබුජං

අම්ම කියයි පොල් ගාපං
අක්ක කියයි අතු ගාපං
දිය ඇදපං දර පලපං
හැම දේටම සකලබුජං

නිදි මැරුවා සකලබුජං
ටොකු කෑවා සකලබුජං
ළමා දිවිය බැල මෙහෙයට
දිය කෙරුවා සකලබුජං

තිස් වසකට පෙර දිනයක
අපේ අතින් වුන වරදට
සකලබුජං
අනේ මචං
සමාවෙයං

**රසික සූරියආරච්චි**

## මංගල රාත්‍රිය

මනාලියඃ පාණය ද ලසු කොට සුරැකිය
රන් තිළිණෙ ඔහු නමට පුද දෙන
දිනය අද මගෙ
සිහිනය පුබුදන

මනාලයාඃ හාද වූ සිව් වසරට
ඔබා බැලූ ඒ මල්ල ලිහනා
දිනය අද මගෙ
කුතුහලය සංසිඳවන

**සුභානි හේරත්**
ඇට්වුඩ්

## පියඹන සිතුවිලි

සිතුවිලි මංමාවත් වල
පියාඹන මා සිතුවිලි
පෑන් තුඩකට කොටු කරගන්නට
දුන්නාට ඉඩ
තුති පුදමි මෙසේ!!

එක් නිමේෂයක පිබිදුණු මා
දුටිමි කුරුල්ලෙකු
මංමාවත් නැති පාළු අහසේ
ඔහේ පියාඹා යන අපූරුව

දැහැන් ගත මා සිතුවිලි වලට හැඟුණේ
ඇයි මටත් එසේ පියාඹා යන්නට බැරි
නැත.. නැත කිසිදු සමාවක් නැත
දිනෙන් දින හිරු සමඟ, සඳු සමඟ
ගැටෙන්නට උරක් ඇත මට
නගන්නට පවුරක් ඇත
රකින්නට ආත්මයක් ඇත
ඉතිං කෙසේ නම් ඉගිල යම්ද? මා..
පවුරු, මංමාවත් නැති නිසොල්මන්
ආකාශයේ !!

**සෙව්වන්දි**
ජර්මනිය

## බුදු ගුණ සිහි කර වෙසගේ

අප මහා බෝසතාණෝ
සමතිස් පෙරුම් පුරමින්
කල්ප ගණනක් ගෙවමින්
සසර සැරි සරා විත්
උසස් මිනිසත් බව ලබා ගති..

සැම සම්පතින් අනූන වූ රජකමත්
සෙනෙහෙබර බිම්බා දේවියත්
පෙම්බර කිරිකැටි රාහුල පුත් රුවනත්
හැරදමා ගිහිගෙයි කලකිරී
රජ මැදුරෙන් නික්ම ගොස්
වනගතව සා අවුරුද්දක්
දුෂ්කර මග ගෙවමින්
වීර්ය වඩමින් ස්ව උත්සාහයෙන්
තමා විසින්ම
ධර්මය අවබෝධ කරගෙන
එයම ගුරු කොට ගනිමින්
උතුම් වූ බුද්ධත්වයට පත් වූ සේක.

ඒ උත්තරීතර බුදු දහම
කොතරම් ශ්‍රේෂ්ඨ ද විශිෂ්ට ද අපූරු ද
අතීත, වර්තමාන, අනාගත තුන් කලටම
පිළි ගත හැකි ඒ දහමේ අසිරිය
මොන තරම් පරාර්කාමී ද
එලෝ මෙලෝ දියුණුවට
මග එළි පෙහෙළි කර දෙන
ඒ දහම මිනිස් වර්ගයාටම
සුව සහනත් ළඟා කරන
මහත් වූ ඖෂධයකි
බුදු හිමියනි.

**සෙනෙහෙලතා රත්නායක**
ක්ලේටන්

කියවන්න... ලියන්න... තොරතුරු දැන ගන්න.. www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත් කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.